# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 160/63 — 1975 අප්‍රේල් 23 වැනි බදාදා — 1975.04.23

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


# I වැනි කොටස: (I) වැනි ඡේදය – සාමාන්‍ය

## ජනාධිපතිතුමාණන් විසින් කරන පත් කිරීම් ආදිය

1975 අංක 194/1

ජනා. කා. අංකය : සී. 333 (III)/75

1972 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 101 වැනි වගන්තිය යටතේ, ජනාධිපතිතුමන් පහත සඳහන් පත්වීම් කළ බව මෙයින් දනුම් දෙනු ලැබේ :—

| | |
|---|---|
| 1. වාරිමාර්ග, විදුලිය බලය හා මහාමාර්ග ඇමති, මහජන මන්ත්‍රී, මෛත්‍රීපාල සේනානායක මහතා, | අග්‍රාමාත්‍ය, මහජන මන්ත්‍රිනී, සිරිමාවෝ ආර්. ඩයස් බණ්ඩාරනායක මැතිනිය දනට නිරතවී ඇති තම විදේශීය චාරිකාවෙන් පසු ශ්‍රී ලංකාවට පෙරළා පැමිණෙන තෙක්, 1975 අප්‍රේල් 23 වැනි දින සිට තම රාජකාරිවලට අමතරව, අගමැති වශයෙන් වැඩ බැලීමට. |
| 2. රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු නියෝජ්‍ය ඇමති, මහජන මන්ත්‍රී, ජයකොඩි ආරච්චිගේ ලක්ෂ්මන් ජයකොඩි මහතා, | රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු ඇමති, මහජන මන්ත්‍රිනී, සිරිමාවෝ ආර්. ඩයස් බණ්ඩාරනායක මැතිනිය දනට නිරතවී ඇති තම විදේශීය චාරිකාවෙන් පසු ශ්‍රී ලංකාවට පෙරළා පැමිණෙන තෙක්, 1975 අප්‍රේල් 23 වැනි දින සිට රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු ඇමති වශයෙන් වැඩ බැලීමට. |
| 3. ක්‍රම සම්පාදන හා ආර්ථික කටයුතු නියෝජ්‍ය ඇමති, මහජන මන්ත්‍රී, රත්න දේශප්‍රිය සේනානායක මහතා, | ක්‍රම සම්පාදන හා ආර්ථික කටයුතු ඇමතිවූද, සැලසුම් ක්‍රියාත්මක කිරීමේ ඇමතිවූ ද මහජන මන්ත්‍රිනී, සිරිමාවෝ ආර්. ඩයස් බණ්ඩාරනායක මැතිනිය දනට නිරතවී ඇති තම විදේශීය චාරිකාවෙන් පසු ශ්‍රී ලංකාවට පෙරළා පැමිණෙන තෙක්, 1975 අප්‍රේල් 23 වැනි දින සිට ක්‍රම සම්පාදන හා ආර්ථික කටයුතු ඇමති වශයෙන්ද, සැලසුම් ක්‍රියාත්මක කිරීමේ ඇමති වශයෙන් ද වැඩ බැලීමට. |

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

එච්. සී. ඩී. විජේසිංහ,
ජනාධිපතිතුමාගේ ලේකම්.

1975 අප්‍රේල් 23 වැනි දින,
කොළඹ,
ජනාධිපතිතුමාගේ කාර්යාලයේදීය.

4-554

1 A—ඒ 13474—4,275 (75/04)

**1975 අංක 194/2**

ජනා. කා. අංකය : සී 335 (III)/74

ජනාධිපතිතුමන් විසින් 1972 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 103(1) වැනි වගන්තිය යටතේ, භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්, එල්. බී. අබේරත්න මහතා 1975 අප්‍රේල් 22 වැනි දින සිට තම රාජකාරිවලට අමතරව, මුදල් අමාත්‍යාංශයේ ලේකම් හා භාණ්ඩාගාරයේ ලේකම්, සී. ඒ. කුරේ මහතා ශ්‍රී ලංකාවට පෙරළා පැමිණෙන තුරු, මුදල් අමාත්‍යාංශයේ ලේකම් හා භාණ්ඩාගාරයේ ලේකම් වශයෙන් වැඩ බැලීමට පත් කළ බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

එච්. සී. ඩී. විජේසිංහ,
ජනාධිපතිතුමාගේ ලේකම්.

1975 අප්‍රේල් 22 වැනි දින,
කොළඹ,
ජනාධිපතිතුමාගේ කාර්යාලයේදීය.

4-555

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී